# තාරකා විජිතයට



# පසු වදනක්....

නිශාධි, අනුරාධ, දිලීප, සඳලි.......
මම පසුගිය මාස 19 දිවා රෑ ඔවුන් සමඟින් ජීවත් වූයෙමි. ඔවුනගේ දුක සතුට ඇති තරම් විඳ ගත්තෙමි. ඒ සංවේදනය ඔබට ගෙනෙන්නට සුදුසුම වචන සොයා වරු ගණන් කල්පනා කළෙමි. ඔවුන් නික්ම ගිය පසු දැන් ඔබට සේම මට ද මහත් පාලුවක් දැනෙයි. 'තාරකා විජිතය' ට පසු වදනක් ලියන්නට සිතුණේ එනිසා විය හැකි ය.

ශ්‍රී ලංකාවේ දී ළං වන්නට වත් නොහැකි කලාකරුවෝ කලා කාරියෝ විප්‍රවාසී අපට නිතර හමුවෙති. බොහෝ කුලුපග වෙති. (ආපසු ලංකාවට ගිය පසුව ඒ බොහෝ අයට නැවත අප අමතක වෙයි. එය වෙනම කතාවකි) තමන්ගේ ආදරය දිනාගත් රංග ශිල්පීන් ශිල්පිණියන් හා එක්ව දින කීපයක් හෝ ගත කරන්නට ලැබීම විප්‍රවාසී බොහෝ අයට සතුටක් ගෙන දෙන්නකි. සමහර විටෙක මේ සුහදතා සාමාන්‍ය යාලු මිත්‍ර කම් වලින් ඔබ්බට ගොස් දැඩි ආත්මීය බැඳුම් බවට පත්වෙනු අපි දකිමු. තවත් සමහර විටෙක එතැනින් ඔබ්බට යනු ද අපි දැක ඇත්තෙමු. 'තාරකා විජිතය' ට වස්තු බීජය සැපයුවේ මෙවන් සබඳතාවකි. වෙනසක් කිරීමේ අවශ්‍යතාව හා අපූර්වත්වයක් ඇති කිරීමේ අවශ්‍යතාව මත මම මේ පෙම් සබැඳියාවේ ආරම්භය ලෝකාන්තයට ගෙන ගියෙමි. නිෂාධි නම් වන තරුණ කාන්තාව හා අනුරාධ නම් වන රංගන ශිල්පියා ගේ ප්‍රේමය 'තාරකා විජිතය' ආවේ එලෙස ය.

''මේ ඇත්ත කතාවක් නේද..?'' යි ඇසූ බොහෝ දෙනාට ඒ පිළිතුර සෑහේ යයි සිතමි.

දිලීප ගේ චරිතය ගොඩ නැගීම සඳහා මා දන්නා හඳුනන කීප දෙනකුගේ චරිත ස්වාභාවයන් එක්තැන් කරන්නට මට සිදුවිය. ශ්‍රී ලාංකිකයන් දෙස පිළිකුල් ඇසින් බලන, සිංහල සිනමා පටයක්, සංගීත ප්‍රසංගයක්, ටෙලි නාට්‍යයක් කිසිදා නොබලන සිංහලයන් අනන්තව මට හමුවී ඇත.

''මම වැඩි ගාණක් දීලා මයර් එකෙන් බඩු ගන්නවා කේමාට් එකේ ඒ බඩුවම කොයි තරම් ලාබෙට තිබුණත්.'' මගේ එවන් හිතවතෙක් වරෙක මා සමඟ කිවේ ය. මම ''ඇයි..?'' දැයි ඇසුවෙමි.

''කේ මාට් එකේදි ලංකාවෙ එවුන් හමුවෙන නිසා..'' ඔහු ක්ෂණිකව පිළතුරු දුන්නේ ය.

''මං ලංකාවෙ එවුන් එක්ක කවදාවත් කතා කරන්න යන්නෙ නැහැ.. '' තවත් අයෙක් වරක් මා සමග කීහ. ඔහු දැක්වූයේ අපූරු හේතුවකි ''.... මේ හැම එකාම අයිය මල්ලි කියලා මට කතා කරන එක මට පෙන්නන්නම බැහැ..''

මේ අපූරු පුද්ගලයන් හා විවාහ වී සිටින්නේ සාමාන්‍ය සිතුම් පැතුම් ඇති ලංකාවේ

*ශ්‍රී ලංකාවේ දී ළං වන්නට වත් නොහැකි කලාකරුවෝ කලා කාරියෝ විප්‍රවාසී අපට නිතර හමුවෙති. බොහෝ කුලුපග වෙති. තමන්ගේ ආදරය දිනාගත් රංග ශිල්පීන් ශිල්පිණියන් හා එක්ව දින කීපයක් හෝ ගත කරන්නට ලැබීම විප්‍රවාසී බොහෝ අයට සතුටක් ගෙන දෙන්නකි. සමහර විටෙක මේ සුහදතා සාමාන්‍ය යාලු මිත්‍ර කම් වලින් ඔබ්බට ගොස් දැඩි ආත්මීය බැඳුම් බවට පත්වෙනු අපි දකිමු. තවත් සමහර විටෙක .......*

සාමාන්‍ය තරුණියන් ය. තම සැමියන් ගේ අසාමාන්‍ය ගති පැවතුම් නිසා මේ කාන්තාවන් මානසිකව විඳවන සැටි මම දැක ඇත්තෙමි. එවන් විඳවීමක අවසානය කුමක් විය හැකි ද?

පුදුමයට මෙන් මෙවන් අපූරු අසාමාන්‍ය ගති ලක්ෂණ පෙන්වන සියල්ලන්ම පාහේ ඉතා ඉහළ අධ්‍යාපනයක් ලද්දෝ වෙති. සිය ආචාර්ය උපාධිය සඳහා සූදානම් වෙමින් සිටින දිලීප ගේ චරිතය ගොඩ නංවන්නට මා වෙර දැරුවේ මේ සියලු ගති ලක්ෂණ සමගින් ය.

සුපුරුදු ලෙසම, ලෝකාන්තයෙන් කතාව ආරම්භ කළා විනා, එතැනින් ඔබ්බට මේ කතාව කෙසේ ගලා යනු ඇද්දැයි මම කල්පනා නොකළෙමි. මාසයෙන් මාසය ඒ ඒ චරිත දෙස බලා සිට ඊළඟ කොටස ගැන සිතුවා විනා මෙවන් අවසානයක් කරා මේ කතාව ගෙන යන්නෙමැයි පූර්ව නිගමනයක් මගේ සිතේ නොවුණි.

යන එන තැනදී හමුවී 'තාරකා විජිතය' ගැන මා හා කතා කළ හඳුණන නාඳුණන පාඨකයනගේ උනන්දුව මට මහත් ශක්තියක් විය.

'තාරකා විජිතය' මට ගීතයක් සේ දැනුණි. මම මනසින් ඒ ගීතවත් ලෝකයේ සැරි සැරුවෙමි. කතාව ලියාගෙන යන අතර දී සිතට ආ කවි පද කතාවටම ඇතුළත් කළෙමි. එනමුදු හෙළිදරව් කළ යුතු යමක් ඇත. 'තාරකා විජිතය' ට මගේ අතින් කවි ලියවුණේ පළමු හෝ දෙවන කොටස දක්වා පමණකි. ඉතිරි කොටස් 17 සඳහාම කවි ලිව්වේ සන්නසේ කවි පිටුව සංස්කරණය කරණ තුෂාරි ප්‍රියංගිකා යි. කතාව ලියා ඇයට විද්‍යුත් තැපෑලෙන් යැවූ විට ඇය පසුදා වන විට අදාල කවි ලියා නැවත එය මට එව්වා ය. බොහෝ පාඨකයන් මේ කවි ඉතා කැමැත්තෙන් කියවූ බව මම දනිමි. එහි ගෞරවය ඇයට හිමි ය.

''ගිම්හාන සුළඟේ'' කෞෂල්‍යාට වුණා වගේ දරුණු දෙයක් නිෂාධිට වෙන්න දෙන්න එපා'' යි කියූ පාඨකයන් අපමණ ය. කතාව අවසානයේ ඔවුන් සැනසුම් සුසුමක් හෙළූ බව ද මම දනිමි.

''මට හරි සතුටුයි ඒ විදිහට ඉවර වුණ එකට... අපි බයෙන් හිටියෙ අනුරාධව මරලා දායි කියලා..'' පසුගිය දිනෙක එක්තරා ප්‍රසංගයකදී හමු වූ නාඳුණන හිතවතෙක් කීවේ ය.

සැබෑවක් කියන්නට අවසර දෙන්න. මම ද ඒ අවසානයට කැමැත්තෙමි.

ජගත් ජේ එදිරිසිංහ

## පසු වදනට පසු වදනක්

''ගිම්හාන සුළඟ'' දයාවංශ ජයකොඩි සමාගමේ ප්‍රකාශණයක් ලෙස ලබන මාසයේදී එළි දැක්වෙයි. 'තාරකා විජිතය' ට කුමක් වනු ඇද්දැයි ඔබ මගෙන් අසනු ඇත. එය ද පොතක් ලෙස එළි දැක්වෙනු ඇත . එයට පෙර 'තාරකා විජිතය' ටෙලි නාට්‍යයක් කළ යුතු යයි අසෝක සිල්වා සොයුරා කළ යෝජනාව මල් එල ගන්වන්නට ශ්‍රීනාත් මද්දුමගේ සොයුරා දැනටමත් අවශ්‍ය කටයුතු අරඹා ඇත. කැළුම් පාලිත මහීරත්න සොයුරා ගේ අධ්‍යක්ෂණයක් වන මේ ගීතවත් වෘත්තාන්තය තරුපති මුණසිංහ සොයුරා ගේ සංගීතයෙන් ඔප වනු ඇත.




